# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2449/25 - 2025 අගෝස්තු මස 13 වැනි බදාදා - 2025.08.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ මාතර ප්‍රාදේශීය සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

ඉල්ලා අස්වීම හේතුකොටගෙන මාතර ප්‍රාදේශීය සභාවේ සභික ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ මාතර ප්‍රාදේශීය සභාවේ අංක 11 කැකණඳුර මධ්‍යම කොට්ඨාසයට තේරී පත් වූ පෙහෙඹිය ලියනගේ අසෝකා අයත් වන්නා වූ ජාතික ජනබලවේගය නම්වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතුයැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම මාතර ප්‍රාදේශීය සභාවේ අංක 11 කැකණඳුර මධ්‍යම කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා පේදුරු ආරච්චිගේ දෝන පවිත්‍රා වීරනායක නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

මාතර ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි, පුලස්ති සේරසිංහ පතිරණ වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66 අ(1)(අ) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් පේදුරු ආරච්චිගේ දෝන පවිත්‍රා වීරනායක මාතර ප්‍රාදේශීය සභාවේ අංක 11 කැකණඳුර මධ්‍යම කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් ප්‍රකාශ කරමි.

**පී. එස්. පතිරණ,**
තේරීම්භාර නිලධාරි,
මාතර ප්‍රාදේශීය සභාව.

2025 අගෝස්තු මස 07 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
මාතර.

EOG 08 - 0131

1A - G 45109 — 09 (2025/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*